# පටුන


1.හැඳින්වීම

1.1 දැක්ම

1.2 මෙහෙවර

1.3.අරමුණු

1.4.කාර්යභාරය

2. සංවිධාන ව්‍යුහය

3.මානව සම්පත් කළමනාකරණය

3.1 කාර්ය මණ්ඩල සංයුතිය

3.2 ස්ථාන මාරු වීම්

3.3 ආයතනික තොරතුරු

3.4 මානව සම්පත් සංවර්ධනය

4. මූල්‍ය කළමනාකරණය

4.1.වැය ඇස්තමේන්තුව -2015

4.2.භෞතික සම්පත් කළමනාකරණය -2015

5.සංවර්ධන කටයුතු

5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම (ඌන ඉඩම් පරිහරණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම)

5.2. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම.

5.3. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම.

5.4. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ

5.5. ජල මූලාශ්‍ර සහ ජල උල්පත් හඳුනා ගැනීම

5.6. නිවාස සඳහා උචිත ඉඩම් හඳුනා ගැනීම

5.7. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම්

5.8. බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන පිහිටුවීම.

5.9. හායනයට පත් ඉඩම් පුනරුත්තාපනය කිරීමේ වැඩසටහන්.

5.10. ඉඩම් පරිහරණ සැලසුම් කරණය පිළිබඳ පාසැල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

5.11. විශේෂ අධ්‍යයන .

5.12. ඉඩම් පරිහරණ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාම.

5.13. වෙනත් ව්‍යාපෘති.

5.14. වාර්ෂික වැඩ සැලැස්ම පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම.

5.15.දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය.

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 01.හැඳින්වීම

ශ්‍රී ලංකාව සඳහා විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම් ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා වර්ෂ 1983 දී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙන් පිහිටුවන ලදි. මෙම විෂයයේ කාලීන වැදගත්කම හා කාර්යභාරය පුළුල් වීමත් සමගම මෙම ආයතනය 2010 වසරේ සිට දෙපාර්තමේන්තුවක් ලෙස උත්ශ්‍රේණි ගත කරන ලදි.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට පිහිටා ඇති අතර දිස්ත්‍රික් කාර්යාල 25 කින් යුක්ත වේ.1988 වර්ෂයේ දී දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් 25ක් බඳවා ගත් අතර 1994 සහ 1999 වර්ෂ වල සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් 62 දෙනෙකු බඳවා ගන්නා ලදි. එමෙන්ම දෙපාර්තමේන්තුවේ සිදු කරන කාර්යයන් වඩාත් විධිමත් කිරීම සඳහා 2005 වර්ෂය තුල දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සහකාර නිලධාරීන් 269 දෙනෙකු බඳවා ගත් අතර තවදුරටත් ක්ෂේත්‍ර වැඩ කටයුතු පුළුල් කිරීම සඳහා උපාධිධාරී අභ්‍යාසලාභී පදනම යටතේ 2013 වර්ෂයේ සහ 2014 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් ලෙස 176 දෙනෙකු බඳවා ගෙන දීප ව්‍යාප්තව අනුයුක්ත කර ඇත. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් 14 දෙනෙකු කුසලතා පදනම මත 2015 .03.31 දින සිට සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) ලෙස පත් කරන ලද අතර, ප්‍රධාන කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ( කෘෂි ආර්ථික විද්‍යා ) තනතුර සඳහා සීමිත තරග විභාගයක් මගින් 2015.05.11 දින සිට නිලධාරියෙකු පත් කරන ලදි. එමෙන්ම පෙර පැවති සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි හා ඉඩම් පරිහරණ සැලසුම් සහකාර යන තනතුරු නාමයන් “ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි” ලෙස එක් තනතුරු නාමයක් ලෙස වෙනස් කරන ලදි.

### 1.1.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම

“ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත සහ තිරසාර ලෙස පරිහරණය කිරීම.”

### 1.2.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශය

භූමිය පරිහරණය කරන්නන් ද ඇතුළුව අපගේ සියලු පාර්ශව කරුවන් තෘප්තිමත් වන සේ කාර්යක්ෂම මෙන් ම සේවයට කැප වූ කාර්ය මණ්ඩලයක් විසින් පාරිසරික සමතුලිතතාව පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

### 1.3.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු 05 කි.

01.ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.

02.ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම.

03.සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත් පාරිසරික සමතුලිතතාව රැකෙන පරිදි භාවිතා කිරීමට හැකි වන සේ උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.

04.භූමිය පදනම් කර ගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.

05.විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුම පුහුණුව හා අධ්‍යනය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.4 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

මෙම දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

(01.) ප්‍රධාන කාර්යයන් වශයෙන් ගැනෙන විශාල මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු.

(02.) අතිරේක කාර්යයක් වශයෙන් සැලකෙන කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු. මේ පිළිබඳ විස්තර සැකවින් පහත දැක්වේ.

**<u>විශාල පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>**

පළාත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම මේ යටතට ගැනේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සහ උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රමුඛත් වය ලබා දී ඇත.

**<u>කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>**

මේ යටතේ තෝරා ගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම, හායනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීමත්, රාජ්‍ය ආයතන හා රජයේ පාසැල් පරිශ්‍රයන් වල ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ස්ථාපිත කිරීමත් සහ විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව භාවිතා නො කර තිබෙන භූමි ප්‍රදේශ සඳහා භූමි යෝග්‍යතා අධ්‍යයන වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

**ඉහත ප්‍රධාන කාර්යයන් වලට අමතරව එම කාර්යයන් වඩාත් පහසු කිරීම සඳහා**

01. විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා පාදක වන ඉඩම් පරිහරණ තොරතුරු දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම

02. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම.

03. ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම පිලිබඳව රාජ්‍ය නිලධාරීන්, ගොවි ප්‍රජාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම.

04. ඉඩම් පරිහරණ ගැටලු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ කමිටු ස්ථාපිත කර පවත්වා ගෙන යාමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

# 03.මානව සම්පත් කළමනාකරණය

## 3.1. කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටි සංඛ්‍යාව | 2015 වර්ෂය තුළ සිදු වූ වෙනස් වීම් | | | | | ප්‍රවර්තන වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම යෑම | ස්ථාන මාරු | | බඳවා ගැනීම් | උසස් වීම් | |
| | | | | | ගිය | පැමිණි | | | |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | - | - | - | - | 01 |
| 02 | අධ්‍යක්ෂ පාලන | 01 | - | - | - | - | - | - | - |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 01 | - | - | - | - | - | - | - |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉ.ප.සැ.) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 05 | ගණකාධිකාරී | 01 | 01 | - | - | - | - | - | 01 |
| 06 | අභ්‍යන්තර විගණක | 01 | - | - | - | - | - | - | - |
| 07 | සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 08 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 09 | සහකාර අධ්‍යක්ෂ (සමාජ විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (ශෂ්‍ය විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 11 | සහකාර අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 01 | - | - | - | - | - | - | 01 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (ඉ.ප.සැ.) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 13 | පරිගණක පද්ධති විශ්ලේෂක/වැඩ සටහන් සම්පාදක | 01 | 01 | - | - | - | - | - | 01 |
| 14 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) | 25 | 15 | 01 | - | - | - | 01 | 13 |
| 15 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | 294 | 294 | - | - | - | - | - | 294 |
| 16 | රාජ්‍ය කළමනාකරණ සහකාර (අධි පන්තිය ) | 01 | - | - | - | - | - | - | - |
| 17 | සංවර්ධන නිලධාරි | 200 | 172 | - | 01 | 22 | - | - | 193 |
| 18 | අයවැය සහකාර | 01 | - | - | - | - | - | - | - |
| 19 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 50 | 24 | - | 05 | 09 | - | - | 28 |
| 20 | තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර | 02 | 02 | - | - | - | - | - | 02 |
| 21 | රියදුරු | 29 | 13 | - | 01 | 03 | 14 | - | 29 |
| 22 | කාර්යාල කාර්ය සහායක | 37 | 29 | - | 01 | - | 08 | - | 36 |
| 23 | ශිල්පිය සහායක | 25 | 19 | - | - | - | - | - | 19 |
| 24 | කළමනාකරණ සහකාර | - | - | - | - | - | 11 | - | 11 |
| එකතුව | | 677 | 577 | 01 | 08 | 34 | 33 | 01 | 635 |

## 3.2. ස්ථාන මාරු පිළිබඳ විස්තර

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | | |
|---|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | අනුප්‍රාප්තිකයාගේ නම | දිනය | රාජකාරි ස්ථානය |
| 01 | ඩී.සී.ඒ.එන්.ප්‍රියන්ති මිය (තො.සං.තා.ස.) | 2015.02.02 | මෝටර් රථ ප්‍රවාහන දෙපා. | ඩබ්.සී.ජේ.ෆොන්සේකා මයා (තො.සං.තා.ස.) | 2015.03.12 | මෝටර් රථ ප්‍රවාහන දෙපා. |
| 02 | ඩබ්.ජී.පුනාලතා මිය (තො.සං.තා.ස.) | 2015.02.02 | මෝටර් රථ ප්‍රවාහන දෙපා. | පී.වී.ඒ.ප්‍රේමලතා මිය (තො.සං.තා.ස.) | 2015.02.05 | මෝටර් රථ ප්‍රවාහන දෙපා. |
| 03 | එම්.ඒ.ඒ.ප්‍රසාද්සිංහ මයා (රා.ක.ස.) | 2015.02.05 | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | එල්.ටී.තිරාණගම මිය (රා.ක.ස.) | 2015.02.10 | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 04 | ඩී.එම්.නන්දාවති මිය (රා.ක.ස.) | 2015.02.02 | දි.ලේ. කාර්යාලය-මොණරාගල | කේ.එම්.එච්.ජී.බණ්ඩාර මිය (රා.ක.ස.) | 2015.02.02 | දි.ලේ. කාර්යාලය-මොණරාගල |
| 05 | අයි.ඒ.කේ.ඩී.රත්නායක මිය (රා.ක.ස.) | 2015.02.23 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපා. | - | - | - |
| 06 | - | - | - | යූ.කේ.කේ.එච්.විජය බණ්ඩාර (රියදුරු) මයා | 2015.02.16 | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ලේකම් කාර්යාලය |
| 07 | - | - | - | ඒ.ඒ.ආර්.එම්.අමරසිංහ මයා (රියදුරු) | 2015.02.09 | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ලේකම් කාර්යාලය |
| 08 | - | - | - | එස්.ඩබ්.වික්‍රමසිංහ මයා (රියදුරු) | 2015.04.06 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 09 | එස්.එස්.කිංස්ලි මයා (රා.ක.ස.) | 2015.06.01 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපා. | - | - | - |
| 10 | ඒ.පී.වයි.ඒ.රාජපක්ෂ මයා (රියදුරු) | 2015.07.02 | මුදල් අමාත්‍යාංශය | - | - | - |
| 11 | ඒ.එස්.එම්.ඩී.ආර්.ජයවීර මයා (කා.සේ.සේ.) | 2015.10.01 | ක්‍රීඩා අමාත්‍යාංශය | - | - | - |
| 12 | එල්.ටී.තිරාණගම (රා.ක.ස.) | 2015.10.20 | ප්‍රා.ලේ. අරණායක | - | - | - |
| 13 | ඩී.එච්.බී.අයි.එන්.සිල්වා | 2015.02.09 | ගොවිජන සංවර්ධන දෙපා. | | | |
| 14 | | | | පී.ජී.ටී.එස්.කුමාර මයා (සංවර්ධන නිලධාරි ) | 2015.02.19 | ආර්ථික සංවර්ධන අමා. |
| 15 | - | - | - | ඊ.එම්.යූ.ජී.ආර්.කේ.ඒකනායක මයා ( සංවර්ධන නිලධාරි ) | 2015.02.25 | නිවාස හා සමෘධි අමා. |
| 16 | - | - | - | ඒ.ලෝගවාදිනි මිය ( සංවර්ධන නිලධාරි ) | 2015.03.04 | නිවාස හා සමෘධි අමා. |
| 17 | - | - | - | පි.ජී.එස්.එස්.කේ රංජිත් මයා (සංවර්ධන නිලධාරි ) | 2015.03.08 | නිවාස හා සමෘධි අමා. |
| 18 | - | - | - | කේ.එම්.එන්.ප්‍රියන්ති මෙනවිය ( සංවර්ධන නිලධාරි ) | 2015.03.12 | නිවාස හා සමෘධි අමා. |
| 19 | - | - | - | එච්.ඒ.ටී.සම්පත් මයා (සංවර්ධන නිලධාරි ) | 2015.03.19 | නිවාස හා සමෘධි අමා. |
| 20 | - | - | - | ආර්.එම්.ආර්.රත්නායක මෙනෙවිය(සංවර්ධන නිලධාරි) | 2015.03.23 | නිවාස හා සමෘධි අමා. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | - | - | - | එච්.පී.සී.ඩී.ශ්‍රීමාලි මෙනෙවිය (සංවර්ධන නිලධාරි ) | 2015.03.24 | නිවාස හා සමෘධි අමා. |
| 22 | - | - | - | පී.එම්.එස්.ආර්.වීරසිංහ මයා (සංවර්ධන නිලධාරි ) | 2015.04.01 | නිවාස හා සමෘධි අමා. |
| 23 | - | - | - | ආර්.එම්.ඩබ්.රත්නායක මයා (සංවර්ධන නිලධාරි ) | 2015.04.01 | නිවාස හා සමෘධි අමා. |
| 24 | - | - | - | ජ්.ටි.සම්පත් මයා (සං.නි.) | 2015.04.22 | නිවාස හා සමෘධි අමා. |
| 25 | - | - | - | ජ්.ජී.පද්මලතා මිය (සං.නි.) | 2015.05.07 | නිවාස හා සමෘධි අමා. |
| 26 | | | | එස්.අරුල්වෙල්වම් මයා (සං.නි.) | 2015.06.01 | දිවිනගුම සංවර්ධන දෙපා |
| 27 | | | | ජ්.ජේ.ජෙෆිනා උම්මා මිය (සං.නි.) | 2015.06.01 | දිවිනගුම සංවර්ධන දෙපා |
| 28 | | | | එස්.ක්‍රිෂ්ණාසින්දු මිය (සං.නි.) | 2015.06.01 | නිවාස හා සමෘධි අමා. |
| 29 | - | - | - | ජ්.විජිහරන් මයා (සං.නි.) | 2015.06.02 | දිවිනගුම සංවර්ධන දෙපා |
| 30 | - | - | - | ටි.ප්‍රදීපන් මයා (සං.නි.) | 2015.06.02 | දිවිනගුම සංවර්ධන දෙපා |
| 31 | - | - | - | ආර්.එම්.සී.කේ.රත්නායක මිය (සං.නි.) | 2015.06.02 | නිවාස හා සමෘධි අමා. |
| 32 | - | - | - | ජ්.එම්.ජ්.බී.අත්තනායක මයා (සං.නි.) | 2015.06.10 | නිවාස හා සමෘධි අමා. |
| 33 | - | - | - | ඩබ්.ඩී.අයි.පී.දිසානායක මිය (සං.නි.) | 2015.06.17 | ස්වදේශ කටයුතු අමා. |
| 34 | - | - | - | ජී.එච්.එස්.ජ්.රණසිංහ මිය (සං.නි.) | 2015.07.02 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපා. |
| 35 | - | - | - | වී.ශ්‍රීතරන් මයා (සං.නි.) | 2015.07.02 | දිවිනගුම සංවර්ධන දෙපා. |
| 36 | - | - | - | ජී.ඩබ්.ප්‍රසන්න මයා (සං.නි.) | 2015.07.02 | නිවාස හා සමෘධි අමා. |

## 3.3.ආයතනික කටයුතු

| අනු අංකය | විස්තර | පෙර වසර (2014) | | | ප්‍රවර්තන වසර (2015) | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව |
| 01 | සේවයට බඳවා ගැනීම | 176 | 200 | 24 | 09 | - | - |
| 02 | විභාග පැවැත්වීම | - | - | - | 03 | - | - |
| 03 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | - | - | - | 04 | - | - |
| 04 | සේවය ස්ථිර කිරීම | - | - | - | 03 | - | - |
| 05 | උසස් කිරීම | 04 | 04 | - | 01 | - | - |
| 06 | වැටුප් වර්ධක ගෙවීම | සියළුම | සියළුම | - | සියළුම | සියළුම | - |
| 07 | සේවය දීර්ඝ කිරීම | - | - | - | - | - | - |
| 08 | බඳවා ගැනීම් පටිපාටි සැකසීම | - | - | - | - | - | - |
| 09 | සේවය හැර යාම | - | - | 01 | 01 | - | - |
| 10 | වැඩ තහනම් කිරීම | - | - | - | - | - | - |
| 11 | නැවත සේවයේ පිහිටුවීම | - | - | - | - | - | - |
| 12 | විනය පරීක්ෂණය | - | - | - | - | - | - |
| 13 | විදේශ නිවාඩු අනුමත කිරීම | - | - | - | 13 | - | - |
| 14 | විදේශ ශිෂ්‍යත්ව | - | - | - | 07 | - | - |
| 15 | අමාත්‍ය මණ්ඩල සංදේශ | - | - | - | - | - | - |
| 16 | ඇප ආරම්භ කිරීම | - | - | - | - | නැත | - |
| 17 | ඇප නිදහස් කිරීම | - | - | - | - | නැත | - |
| 18 | ණය අනුමත කිරීම | 193 | 193 | - | 151 | 151 | - |
| 19 | දේපළ | 100 | 100 | - | 09 | 09 | - |
| 20 | වාහන | - | - | - | - | - | - |
| 21 | වෙනත් - ආපදා | 93 | 93 | - | 142 | 142 | - |
| 22 | මුදා හැරීම් | - | - | - | 05 | - | - |

# 3.4.මානව සම්පත් සංවර්ධනය

**විදේශීය පුහුණු -2015 වර්ෂය**

| අනු අංකය | පාඨමාලාව | නිලධාරියාගේ නම | තනතුර | විදේශ පුහුණුව ලැබූ රට | කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01. | මැනුම් හා සිතියම් ආයතන වල ධාරිතා වර්ධනය | ආර්.එම්.ආර්.ඩී.කරුණාරත්න මිය | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | කොරියාව | 2015-අප්‍රියෙල් 18 – මැයි -10 |
| 02 | ඉඩම් ප්‍රතිපත්ති හා සැලසුම් සංවර්ධනය | ඩබ්ලිව්.එම්.වනසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ (සමාජ විද්‍යා) | කොරියාව | 2015 ජුනි -25 – ජූලි 15 |
| 03 | ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර සහ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය | ඩබ්ලිව්.ඒ.මනුක සම්පත් මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඉන්දියාව | 2015 - ජූලි 8 – සැප්තැම්බර් - 10 |
| 04 | මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ජපන් ශිෂ්‍යත්ව | බී.ජී.එස්.කරුණාරත්න මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ජපානය | 2015 - අගෝස්තු 16– 2017 අගෝස්තු - 15 |
| 05 | ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර සහ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය | කේ.ඩී.නිලන්ත මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඉන්දියාව | 2015- ඔක්තෝම්බර් 6 – දෙසැම්බර් - 3 |
| 06 | සංවර්ධනය වන රටවල් සඳහා ඉඩම් පරිහරණ සැලසුම් | අයි.එල්.මොහොමඩ් සකීර් මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | චීනය | 2015 ඔක්තෝම්බර් - 14 නොවැම්බර් - 3 |
| 07 | ඕස්ට්‍රේලියානු ඉඩම් පරිපාලන කටයුතු පිළිබඳ දැනුම හුවමාරුව | පී.එම්.ශාන්ති ප්‍රනාන්දු මිය | අධ්‍යක්ෂ ජනරාල් | ඕස්ට්‍රේලියාව | 2015 ඔක්තෝම්බර්- 19 - නොවැම්බර් - 13 |

**දේශීය පුහුණු**

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01 | භූවිද්‍යා තොරතුරු පද්ධති මාර්ගයෙන් සිතියම් සැකසීම | නිලධාරීන් 5 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය | දින 03 |
| 02 | ක්ෂේත්‍ර පුහුණු | නිලධාරීන් 36 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය | දින 02 |
| 03 | කාර්යාල කාර්ය සහයකුගේ වගකීම් | නිලධාරීන් 02 | කාර්යාල කාර්ය සහායක | හැකියා සංවර්ධන අරමුදල | දින 2 |
| 04 | කාර්යාල කළමනාකරණය | නිලධාරීන් 61 | සහකාර අධ්‍යක්ෂ, කළමනාකරණ සහකාර, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි, තොරතුරු පද්ධති සහකාර | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 05 | ක්ෂේත්‍ර පුහුණුව | නිලධාරීන් 37 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | අම්පාර දිස්ත්‍රික් කාර්යාලය | දින 03 |

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 06 | භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය පිළිබඳ පාඨමාලාව | නිලධාරීන් 13 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | ඉඩම් පරිහරණ කාර්යාලය පොලොන්නරුව | දින 02 |
| 07 | භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව | නිලධාරීන් 06 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | දින 06 |
| 08 | ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම | නිලධාරීන් 25 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | ඉඩම් පරිහරණ කාර්යාලය බදුල්ල | දින 02 |
| 09 | භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය පිළිබඳ පුහුණුව | නිලධාරීන් 21 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | ඉඩම් පරිහරණ කාර්යාලය මොණරාගල | දින 02 |
| 10 | මූලික ඉඩම් නීති | නිලධාරීන් 57 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | මාතලේ දිස්ත්‍රික් කාර්යාලය | දින 01 |
| 11 | වැටුප් සැකසීම පිළිබඳ පුහුණුව | නිලධාරීන් 50 | සහකාර අධ්‍යක්ෂ, කළමනාකරණ සහකාර, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි, තොරතුරු පද්ධති සහකාර | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 12 | තොරතුරු තාක්ෂණය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව | නිලධාරීන් 18 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | දින 06 |
| 13 | රියදුරන් සඳහා පුහුණුව | රියදුරු මහතුන් 35 | රියදුරන් | ප්‍රධාන කාර්යාලය | දින 01 |
| 14 | භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව | නිලධාරීන් 05 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | දින 06 |
| 15 | ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ | නිලධාරීන් 25 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | අම්පාර දිස්ත්‍රික් කාර්යාලය | දින 02 |
| 16 | භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | නිලධාරීන් 05 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි, සංවර්ධන නිලධාරි | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | මාස 06 |
| 17 | පශ්චාත් උපාධි පාඨමාලාව සමාජීය විද්‍යාව | නිලධාරීන් 01 | සංවර්ධන නිලධාරි | කැලණිය විශ්ව විද්‍යාලය | අවුරුදු 02 |
| 18 | ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලාව | නිලධාරීන් 04 | රාජ්‍ය කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරි | ඵලදායිතා ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | මාස 04 |
| 19 | හරිත ඵලදායිතාව | නිලධාරීන් 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය කළමනාකරණ සහකාර, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඵලදායිතා ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | දින 01 |
| 20 | හරිත ඵලදායිතාව | නිලධාරීන් 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය කළමනාකරණ සහකාර, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඵලදායිතා ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | දින 01 |
| 21 | ලීන් කළමනාකරණය පිළිබඳ පාඨමාලාව | නිලධාරීන් 04 | රාජ්‍ය කළමනාකරණ සහකාර, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඵලදායිතා ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | දින 01 |
| 22 | පශ්චාත් උපාධි | නිලධාරීන් 04 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | පේරාදෙණිය විශ්ව විද්‍යාලය සහ කැලණිය විශ්ව විද්‍යාලය | අවුරුදු 01 |
| 23 | රාජ්‍ය අංශය සඳහා ඊ ඉගෙනුම | නිලධාරීන් 02 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඵලදායිතා ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | දින 04 |

# 04.මූල්‍ය කළමනාකරණය - 2015

## 4.1.වැය ඇස්තමේන්තු

| | පෙර වර්ෂය (2014 ) | | | වියදමේ ප්‍රතිශතය(%) | ප්‍රවර්තන වර්ෂය (2015) | | | වියදමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | |
| 1 ව්‍යාපෘති 1 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 223,763,329 | 217,467,608 | 6,295,722 | 97.19 | 282,392,938 | 281,652,192 | 740,746 | 99.74 |
| වෙනත් පුනරාවර්තන | 36,556,671 | 35,358,410 | 1,198,261 | 96.72 | 40,574,062 | 39,013,938 | 1,560,124 | 96.15 |
| ප්‍රාග්ධන | - | - | - | - | - | - | - | - |
| 2001 | 9,000,000 | 7,955,110 | 1,044,890 | 88.39 | 20,000,000 | 18,611,099 | 1,388,901 | 93.06 |
| 2002 | 1,800,000 | 1,114,426 | 685,574 | 61.91 | 1,800,000 | 528,103 | 1,271,897 | 29.34 |
| 2003 | 4,850,000 | 4,841,454 | 8,546 | 99.82 | 4,200,000 | 2,718,049 | 1,481,951 | 64.72 |
| 2101 | - | - | - | - | - | - | - | - |
| **2** ව්‍යාපෘති 2 | - | - | - | - | - | - | - | - |
| පෞද්ගලික පඩිනඩි | - | - | - | - | - | - | - | - |
| වෙනත් පුනරාවර්තන | - | - | - | - | - | - | - | - |
| ප්‍රාග්ධන | - | - | - | - | - | - | - | - |
| 2001 | - | - | - | - | - | - | - | - |
| 2002 | - | - | - | - | - | - | - | - |
| 2003 | - | - | - | - | - | - | - | - |
| 2101 | - | - | - | - | - | - | - | - |
| **එකතුව** | **275,970,000** | **266,737,008** | **9,232,992** | **96.65** | **348,967,000** | **342,523,381** | **6,443,619** | **98.15** |

රජයේ අත්තිකාරම් බී ගිණුම

| සීමාවන් | පෙර වර්ෂය (2014 ) | | ප්‍රවර්තන වර්ෂය (2015) | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| උපරිම වැය සීමාව | 15,000,000 | 14,723,409 | 20,920,000 | 20,905,917 |
| අවම බැර සීමාව | 7,000,000 | 9,938,848 | 10,920,000 | 15,029,000 |
| උපරිම හර ශේෂ සීමාව | 50,000,000 | 47,974,425 | 65,000,000 | 55,149,226 |

## 4.2.භෞතික සම්පත් කළමනාකරණය

**චංචල දේපළ**

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්ත්වය | 2015-වර්ෂය තුළ සිදු වන වෙනස් වීම් | | | | වසර අවසානයේ පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම | ලදී ගැනීම | වෙන්දේසි කිරීම | ඉවත් කිරීම | |
| 1 | බර වාහන | - | - | - | - | - | - |
| 2 | කැබ් රථ | 18 | - | 02 | - | - | 20 |
| 3 | මෝටර් රථ | 01 | - | - | - | - | 01 |
| 4 | වෑන් | 01 | 02 | - | - | - | 03 |
| 5 | ජීප් රථ | 12 | - | - | - | - | 12 |
| 6 | මෝටර් සයිකල් | - | - | - | - | - | - |
| 7 | පාපැදි | 01 | - | - | - | - | 01 |
| 8 | ඩුප්ලිකේටර් යන්ත්‍ර | 01 | - | - | - | - | 01 |
| 9 | ඡායා පිටපත් යන්ත්‍ර | 32 | - | 01 | 02 | - | 31 |
| 10 | පරිගණක | 156 | - | 21 | - | 04 | 173 |
| 11 | පරිගණක ප්‍රින්ටර්ස් | 46 | - | 06 | 04 | - | 48 |
| 12 | ලැප්ටොප් පරිගණක | 60 | - | 02 | - | - | 62 |
| 13 | ෆැක්ස් යන්ත්‍ර | 30 | - | 07 | 04 | 01 | 32 |
| 14 | යතුරු ලියන (මැනුවල්) | - | - | - | - | - | - |
| 15 | යතුරු ලියන (ඉලෙක්ට්‍රික් ) | - | - | - | - | - | - |
| 16 | සේප්පු | 01 | - | - | - | - | 01 |
| 17 | කැමරා (ඩිජිටල් ) | 26 | - | - | 01 | - | 25 |
| 18 | වීඩියෝ කැමරා | - | - | - | - | - | - |
| 19 | රූපවාහිනී යන්ත්‍ර | 03 | - | - | 01 | - | 02 |
| 20 | රේඩියෝ යන්ත්‍ර | - | - | - | - | - | - |
| 21 | ශීතකරණ | 01 | - | - | - | - | 01 |
| 22 | පරිගණක ප්‍රින්ටර්ස් (වර්ණ) ) | 22 | - | 02 | - | - | 24 |
| 23 | ස්කෑනර් යන්ත්‍ර | 27 | - | | - | - | 27 |
| 24 | මල්ටි මීඩියා උපකරණ | 30 | - | 01 | 01 | - | 30 |
| 25 | ජී.පී.එස් උපකරණ | 94 | 02 | 20 | 03 | - | 113 |
| 26 | අන්තර්ජාල පහසුකම් ( ADSL) | 02 | - | 01 | - | - | 03 |
| 27 | ස්ලයිඩ් ප්‍රෝජෙක්ටර් | - | - | - | - | - | - |

# 05.සංවර්ධන කටයුතු

## 5.1. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සැම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. මෙම කාර්යයේ ප්‍රධාන අරමුණ වනුයේ මෙරට භූමි සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීමය. එසේ වුවද බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල භූමි පරිහරණය සැලකූ විට කොට්ඨාශයේ භූමියෙන් වැඩි ප්‍රතිශතයක් දැනටමත් විවිධ කාර්යයන් සඳහා භාවිතා කර ඇති බව පැහැදිලි වේ. පවත්නා පරිහරණයේ සිදු කල යුතු වැඩිදියුණු කිරීම් සඳහා සංරක්ෂණය කල යුතු ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහාත් මෙම සැලසුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

2015 වර්ෂයේ දී ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා 202ක වැඩ අවසන් කර ඇත. අදාළ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා වලින් නිර්දේශ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති වාර්තා 53 කට ප්‍රතිපාදන නිදහස් කර ඇත.

<u>**2015 වර්ෂයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් අවස්ථාවන්**</u>

මාතර දිස්ත්‍රික්කය





## 5.2. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණය විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීමේ දී විවිධ තොරතුරු දත්ත සහ උපදෙස් ලබා ගැනීමටත් සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් විවිධ දෙපාර්තමේන්තු/ ආයතන වල නියෝජනයක් සහිත ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

01. ජාතික මට්ටම -ජාතික ඉඩම් පරිහරණ සැලසුම් මෙහෙයුම් කමිටුව
02. දිස්ත්‍රික් මට්ටම -දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව
03. ප්‍රාදේශීය මට්ටම -ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව
04. ග්‍රාමීය මට්ටම - ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව

මෙම කමිටු වලින් කාලීන වැදගත්කම අනුව දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ලේකම්වරයා මෙම කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අතර සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාල හරහා මෙම කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය සිදු වේ. මෙම කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු අතර විශේෂ හා හදිසි රැස්වීම් කැඳවීමට දිසාපති/දිස්ත්‍රික් ලේකම්ට පිළිවන.

කමිටුවට ඉදිරිපත් වන කරුණක් පිලිබඳව තීරණයක් ගැනීම සඳහා විස්තරාත්මක අධ්‍යනයක් කල යුතු යැයි හැඟෙන අවස්ථාවල දී ඒ සඳහා කමිටු සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත් කල හැකි අතර අවශ්‍ය පරිදි ඒ ඒ විෂයයන් සඳහා විශේෂඥයන් ද අනු කමිටුවට පත් කළ හැකිය.

**කමිටුවේ කාර්ය භාරය :-**

01. දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රයෝජනයට ගත හැකි දැනට හිස් ව පවතින ඉඩම් පිළිබඳ තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.

02. ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය තුළ යෝජිත සංවර්ධන වැඩසටහන් වලට අනුව ප්‍රමුඛතාවය දිය යුතු අංශ නිශ්චය කිරීම.

03. නාගරික සහ ග්‍රාමීය අංශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.

04. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නැගෙන විවිධ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම සහ නිදහස් කිරීම

ඉහත ප්‍රධාන කාර්යයන්ට අමතරව පහත සඳහන් කරුණු ද දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

01. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු සම්බන්ධව ජාතික මට්ටමේ කමිටුවට පූර්ව දැනුම් දීමට අදාළ කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණ වැඩිදියුණු කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය සඳහා මග පෙන්වීම.
03. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
04. දිස්ත්‍රික්කය සඳහා සකස් කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ භූමි පරිහරණය සම්බන්ධ පසු විපරම් කටයුතු කිරීම.
05. දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණයට සම්බන්ධ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම.
06. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මේ නිර්දේශ, සාකච්ඡා කර අනුමත කිරීම.

## 2015 වර්ෂයේ පවත්වනු ලැබූ දිස්ත්‍රික් කමිටු අවස්ථාවන්



මන්නාරම දිස්ත්‍රික්කය



කිලිනොච්චි දිස්ත්‍රික්කය

ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ සංයුතිය:-

01. දිස්ත්‍රික් ලේකම් (සභාපති )
02. ප්‍රාදේශීය ලේකම්වරු
03. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) ලේකම්
04. පළාත් ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්
05. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාපෘති )
06. දිසා වන නිලධාරි
07. මිනින්දෝරු අධිකාරි
08. ගොවි ජන සංවර්ධන සහකාර කොමසාරිස්
09. නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ
10. පළාත් පාලන සහකාර කොමසාරිස්
11. සහකාර අධ්‍යක්ෂ, අපනයන බෝග
12. කළමනාකරු, කුඩා තේ වතු සංවර්ධන දෙපාර්තමේන්තුව
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
14. ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය
15. සහකාර අධ්‍යක්ෂ ,මධ්‍යම පරිසර අධිකාරිය

මීට අමතරව අවශ්‍ය අවස්ථාවල දී දිස්ත්‍රික් ලේකම්ගේ අභිමතය පරිදි වෙනත් දෙපාර්තමේන්තු/ආයතන සඳහා සාමාජිකත්වය ලබා දිය හැකිය.

මේ අනුව 2015 වර්ෂයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු 90 ක් පැවැත්වීමට සැලසුම් කල අතර එයින් කමිටු 80 ක් පවත්වා ඇත. එක් කමිටුවක් සඳහා වෙන් කරන ලද මුදල රු.3000/= කි.

## 5.3. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ උපදෙස් හා මග පෙන්වීම් මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මෙම කමිටුව ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ ඉඩම් පරිහරණ සැලසුම් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ සම්බන්ධීකරණය මත සිදු වේ. ප්‍රාදේශීය ලේකම්වරයා සභාපතිත්වය දරණ මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියා කටයුතු කරනු ඇත.

**කමිටුවේ කාර්යභාරය :-**

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය සම්බන්ධව ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
03. කොට්ඨාශ තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු හඳුනා ගැනීම, ඒවාට විසඳුම් ලබා දීම සහ අවශ්‍ය අවස්ථා වල දී දිස්ත්‍රික් කමිටුව වෙත වාර්තා කිරීම.
04. ඉඩම් පරිහරණ සැලසුම් යෝජනා මත පදනම් වූ දිගුකාලින හා කෙටිකාලින යෝජනා සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙළක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කල යුතු කාර්යයන් ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම. මෙය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාර්ෂික සැලැස්මට ඇතුළත් කරගත යුතු ය.
05. ජාතික/දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු වලට ඉඩම් පරිහරණ කාර්යයන් පිලිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
06. ඉඩම් බෙදා දීම හා වෙන්කරදීම, ඉඩම් කච්චේරිය පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව මගින් අවශ්‍ය නිර්දේශ ලබා දීම.
07. රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කමිටුවේ නිර්දේශය මත සිදු වේ.
08. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ඉඩම් පරිහරණ සැලසුම් කමිටු සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම.
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
10. විවිධ කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමේ දී යෝග්‍යතාවය පදනම් කර ගෙන අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම්.
11. ප්‍රාදේශීය මට්ටමෙන් ඉඩම් පරිහරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා දිස්ත්‍රික් දත්ත පද්ධතිය හා ඒකාබද්ධ කිරීම.

**කමිටුවේ සංයුතිය :-**

01. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
02. ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි (ලේකම්)
03. ඉඩම් නිලධාරි/ජනපද නිලධාරි
04. කෘෂිකර්ම උපදේශක
05. ගොවිජන සංවර්ධන නිලධාරි
06. අඩවි වන නිලධාරි
07. සහකාර මිනින්දෝරු අධිකාරි
08. පොල්/තේ/රබර්/බහු වාර්ෂික බෝග සඳහා වූ ව්‍යාප්ත නිලධාරීන්
09. සත්ව සංවර්ධන උපදේශක

10. පරිසර නිලධාරි
11. ගොවිජන සංවිධානයේ නියෝජිතයෙක්
12. වැවිලි සහ වතු වගා අංශයේ අදාළ නියෝජිතයින්
13. ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු වලට අදාළ රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතයින්

2015 වර්ෂයේ දී මෙවැනි කමිටු 300 ක් පැවැත්වීමට ඉලක්ක කල අතර කමිටු 335 පවත්වා ඇත. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල, ප්‍රාදේශීය කෘෂිකාර්මික කමිටුව එයට සමගාමීව පවත්වා අදාළ ඉලක්කය ලඟා කර ගත්තද මුදල් වැය වීමක් සිදු වී නොමැත. මෙම එක් කමිටුවක් පැවැත්වීම සඳහා රු.1500/= ක මුදලක් වෙන් කර ඇත.

**<u>2015 වර්ෂයේ පවත්වනු ලැබූ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු අවස්ථාවන්</u>**

ගම්පහ දිස්ත්‍රික්කය



කැලණිය ප්‍රා.ලේ.කො.

පොලොන්නරුව දිස්ත්‍රික්කය



වැලිකන්ද ප්‍රා.ලේ.කො.

## 5.4. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ භූමි භාවිතය පිළිබඳ විවිධ කාල වකවානු වල සකස් කල ඉඩම් පරිහරණ දත්ත ඇතත් යාවත්කාලීන කල තොරතුරු වල හිඟය සැලසුම් සකස් කිරීමේ දී මූලික අඩුපාඩුවක් ව පවතී. එම අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා පොදු මූලධර්ම අනුව සකස් කල මාර්ගෝපදේශයක් ඔස්සේ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයක් ලෙස ආරම්භ කෙරුණි. විවිධ ආයතන සහ දෙපාර්තමේන්තු මෙන් ම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් හට ඉඩම් භාවිතය පිළිබඳ නව දත්ත නොමැති වීම විශාල ගැටලුවක් වන නිසා එම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමටත් මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු වඩාත් ක්‍රමවත් කිරීමටත් මෙම වැඩ සටහන බෙහෙවින්ම ඉවහල් වේ යැයි අපේක්ෂා කරනු ලැබේ.

2015 වර්ෂය අවසන් වන විට 1: 10000 සිතියම් 787 ක් ක්ෂේත්‍රයේ යාවත්කාලීන කිරීම කර ඇත.

## 5.5. ජල මූලාශ්‍ර හා ජල උල්පත් හඳුනා ගැනීම

භූමි සම්පත් කළමනාකරණයේ දී ජල සංරක්ෂණය භූමි සම්පත් සංරක්ෂණය හා අත්‍යාන්තයෙන් ම බැඳී පවතී. එමෙන්ම ජල සම්පත් ආරක්ෂාව සංරක්ෂණය හා එය දූෂණය වීම වැළැක්වීම මෙරට ස්වාභාවික සම්පත් කළමනාකරණයේ දී ඉතාමත් ම වැදගත් තැනක් ගනී. මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉඩම් පිළිබඳ පාර්ලිමේන්තු උපදේශ කාරක සභාවේ නියමය පරිදි ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර හා ජල උල්පත් සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. එපමණක් නොව මෙම ප්‍රතිපත්තිය අංක 1894/3 හා 2014.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර තිබේ.

2015 වර්ෂය තුල දිස්ත්‍රික්ක 18 ක ජල මූලාශ්‍ර පිහිටීමේ විස්තර වාර්තාවක් සකස් කර දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ඉදිරිපත් කර එය දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව හරහා ක්ෂේත්‍ර පරීක්ෂණය කර සංරක්ෂණය හෝ ආරක්ෂා කල යුතු ජල මූලාශ්‍ර සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා පියවර ගෙන ඇත. එමෙන්ම එම වාර්තා අනුසාරයෙන් ජාතික පාරිසරික පනත යටතේ පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස නම් කිරීමේ මූලික කටයුතු සඳහා තොරතුරු මධ්‍යම පරිසර අධිකාරිය වෙත බාර දෙන ලදි. ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ පුරෝගාමී ආයතනවල පුරෝගාමීත්වයෙන් ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම සඳහා 2015.11.24 දින වැඩ මුළුවක් පවත්වන ලදී. 2015 වර්ෂය අවසන් වන විට ආයතන කිහිපයකින් ක්‍රියාත්මක සැලැස්ම සකස් කර ලබා දී ඇත.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම තුලින් ගංගා ඇල දොළ රක්ෂිත සීමා සහ සියලු ආකාරයේ අනෙකුත් ජල මූලාශ්‍ර වල පිහිටීම සිතියම් ගත කරනු ලබන අතර ඒවායේ රක්ෂිත සීමා හඳුනා ගැනීමත් ආරක්ෂා කල යුතු ප්‍රදේශ රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කිරීමත් සඳහා වූ ක්‍රියා මාර්ග ගනු ඇත.

## 5.6. නිවාස සඳහා උචිත ඉඩම් හඳුනා ගැනීම

රජයේ දින 100 යේ වැඩ පිළිවෙල යටතේ ප්‍රමුඛ තා කාර්යයක් වශයෙන් නිවාස අහිමි පවුල් සඳහා නිවාස ලබා දීමේ වැඩසටහනක අවශ්‍යතාවය හඳුනා ගෙන තිබේ. මෙම අරමුණු ලඟා කර ගැනීම සඳහා වැදගත් ම පූර්ව අශ්‍යතාවයක් ලෙස නිවාස සඳහා උචිත ඉඩම් හඳුනා ගැනීම සිදු කල යුතු වේ. නිවාස සඳහා භෞතික වශයෙන් උචිත ඉඩම් අනෙකුත් යටිතල පහසුකම් වලින් සමන්විත නම් ඒවා නිවාස සඳහා යොදා ගැනීම වඩාත් ම ප්‍රඥාගෝචර වේ. මෙහි දී අධික බෑවුම් සහිත ප්‍රදේශ නිවාස සඳහා තෝරා නො ගැනීමටත් එමෙන්ම අහිතකර පාරිසරික සාධක සහිත ස්ථානයන් ඉවත් කිරීමත් සිදු කර වඩාත් උචිත ඉඩම් හඳුනා ගැනීම සිදුකර තිබේ..

2015 වර්ෂය අවසන් වන විට නිවාස සඳහා උචිත ඉඩම් හඳුනා ගැනීමේ දිස්ත්‍රික් වාර්තා 24ක් නිම කර ඉඩම් අමාත්‍යාංශය හා සමෘද්ධි අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

## 5.7. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ක්‍රියාත්මක කිරීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඇති ග්‍රාම නිලධාරි වසම් වල දක්නට ලැබෙන ඉඩම් පරිහරණ ගැටළු සංඛ්‍යාව පදනම් කර ගෙන අදාළ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සුදුසු ග්‍රාම නිලධාරි වසම තුළ ගමක් හෝ දෙකක් තෝරා ගනු ලැබේ. මෙහි දී එම ගම්වැසියන් එයට දක්වන සහයෝගය ද සැලකිල්ලට ගනු ලබන අතර, ඒ අනුව අදාළ දත්ත රැස් කර ගම් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් වලට අදාළ ව්‍යාපෘති වාර්තාව සකසයි. ඉන් පසුව ප්‍රාදේශීය මට්ටමෙන් සේවයේ යෙදී සිටින ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියාගෙන් දිස්ත්‍රික් කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයට අදාළ ව්‍යාපෘති වාර්තා අනුමැතියට යොමු කරයි. එයට අදාළ අනුමැතිය ලැබීමෙන් පසුව සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ)ගේ අධීක්ෂණ මත මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ. මේ සඳහා 2015 වර්ෂය මුල්‍ය ප්‍රතිපාදන වෙන් කරනු ලැබූ අතර ඒ අනුව වියදම් කටයුතු සිදු කර ඇත.2015 වර්ෂයේ ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන 25 ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කල අතර එයින් ආදර්ශන 30 ක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. එක් වැඩසටහනක් සඳහා රු.200,000.00 ක මුදලක් වෙන් කරන ලදී.

**<u>2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන</u>**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**





බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

**ගම්පහ දිස්ත්‍රික්කය**




කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ

## 5.8. බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ වඩාත් ප්‍රචලිත සංවර්ධන වැඩසටහනක් ලෙස බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන සැකසීම සඳහන් කල හැකිය. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ කුඩා ඉඩ ප්‍රමාණයක වඩාත් සැලසුම් සහගත වූ භූමි පරිභෝග රටාවක් ස්ථාපිත කරන ආකාරය පිළිබඳ අවබෝධයක් හා දැනුමක් ලබා දීමත් ඒ පිළිබඳ ඇල්මක් සමස්ත ප්‍රජාව තුළ ඇති කිරීම ය. පාසල් ගෙවතු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍ර හෝ රජයේ පොදු ආයතන මේ සඳහා තෝරා ගනී. විශේෂයෙන් කෘෂි කාර්මික නැඹුරුවක් ඇති මෙවැනි කාලයක මෙම ආදර්ශන ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාව තුළ ප්‍රබෝධයක් ඇතිව තිබේ. මෙම ගෙවතු වගාවේ ඇති වැදගත්කම වනුයේ වස විසෙන් තොර ආහාර වේලක් සපයා ගැනීමට හැකි වීමයි. 2015 වර්ෂයේ දී මෙවැනි බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන 25 ක් ස්ථාපිත කිරීමට ඉලක්ක කල අතර එම වැඩසටහන් 45ක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එක් වැඩසටහනක් වෙනුවෙන් රු.50,000.00 ක මුදලක් වෙන් කරන ලදී.

<u>**2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද බිම් කට්ටි මට්ටමේ සැලසුම් ආදර්ශන**</u>

**ගම්පහ දිස්ත්‍රික්කය**



**අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**කොළඹ දිස්ත්‍රික්කය**



මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

## 5.9. හායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්

ඕනෑම භූමියක් නිසි ලෙස කළමනාකරණය නොකළහොත් එම භූමියේ තත්වය පහත වැටීම නොවැලැක්විය හැකිය. මෙලෙස නිසි ලෙස කළමනාකරණය නොකරනු ලබන කෘෂිකාර්මික භූමි ද විවිධ හේතු නිසා නැවත පුනරුත්ථාපනය කල නොහැකි තත්වයෙන් පහත වැටීම හෙවත් භූමි හායනයට පත් වෙමින් පවතී. මෙම වැඩසටහන යටතේ අප සලකා බලනුයේ මෙබඳු බිම් සංරක්ෂණය කර ආදර්ශමත් ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ග හඳුන්වා දීමයි.

2015 වර්ෂයේ මෙම වැඩසටහ න් 25 ක් පැවැත්වීමට ඉලක්ක කල අතර එයින් වැඩසටහන් 24 ක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එක් වැඩසටහනක් වෙනුවෙන් රු.75,000.00 ක මුදලක් වෙන් කරන ලදී.

**<u>2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්</u>**

**ගම්පහ දිස්ත්‍රික්කය**









**දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

## 5.10. පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ඵලදායි ලෙස ඉඩම් භාවිතා කිරීම පිලිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. අ.පො.ස. උසස් පෙළ භූගෝල විද්‍යා විෂය ධාරාවට ද ඉඩම් පරිහරණ සැලසුම් විෂය ඇතුළත් කර ඇති බැවින් මෙම වැඩසටහන් පැවැත්වීම කාලීනව වැදගත් වී ඇත. 2015 වර්ෂයේ දී පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 220ක් පැවැත්වීමට ඉලක්ක කල අතර වැඩසටහන් 266 පවත්වා ඇත. එක් වැඩසටහනක් වෙනුවෙන් රු.3000/= ක මුදලක් වෙන් කරන ලදී.

**<u>2015 වර්ෂයේ පවත්වන ලද පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**

ගම්පහ දිස්ත්‍රික්කය




**ශාන්ත ෆ්‍රැන්සිස් මහා විද්‍යාලය**

හම්බන්තොට දිස්ත්‍රික්කය




කටුවන ප්‍රා.ලේ.කො. ප්‍රජා දැනුවත් කිරීමක්

## 5.11. විශේෂ අධ්‍යයන

මෙහි දී දිස්ත්‍රික් මට්ටමේ හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමේ හෝ ගම් මට්ටමේ ජනතාවට දැඩිව බලපාන සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළුවක් හඳුනාගෙන ඒ පිළිබඳව විශේෂ අධ්‍යයනයක් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා නිර්මාණශීලී ව ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රධාන කාර්යාලයෙන් අදාළ ව්‍යාපෘති යෝජනා පරීක්ෂා කර බලා යෝග්‍ය වාර්තා සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ. ඒ අනුව 2015 වර්ෂයේ මෙවැනි අධ්‍යනයන් 25ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කළ අතර එයින් අධ්‍යයන 08 ක් නිම කරන ලදී. මාතර, හම්බන්තොට, මොනරාගල, කොළඹ, අනුරාධපුර, ගාල්ල, බදුල්ල සහ පුත්තලම දිස්ත්‍රික්ක වල එම අධ්‍යයන සිදු කර ඇත. එම අධ්‍යයන වෙනුවෙන් ලබා දුන් මුදල රු: 274952කි.

## 5.12 ඉඩම් පරිහරණ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාම

මේ යටතේ යාවත්කාලීන කරන ලද ඉඩම් පරිහරණ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම තොරතුරු යාවත්කාලීන කරනු ලබයි. මාස තුනකට වරක් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාල මගින් යාවත්කාලීන කරනු ලබන දත්ත ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගෙන ප්‍රධාන දත්ත පද්ධතිය යාවත්කාලීන කරනු ලබයි.

01. රජයට අයත් භාවිතා නොකරන ලද ඉඩම් පිළිබඳ නිවැරදි යාවත්කාලීන මධ්‍යගත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.

02. භාවිතයට නොගත් රජයේ ඉඩම් ඵලදායි ලෙස භාවිතා කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම.

03. භාවිතයට නොගත් ඉඩම් සඳහා බෝග වර්ගීකරණයන් සිදු කිරීම තුලින් එම ඉඩම් වඩා සුදුසු කාර්යයන් සඳහා නිර්දේශ කිරීම.

04. සංවර්ධන කටයුතු සඳහා රජයේ හිස් ඉඩම් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබාගත හැකි ක්‍රමවේදයක් සැකසීම.

## 5.13 වෙනත් ව්‍යාපෘති

**(I) උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ අනුව ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම (LLRC.)**

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ පදනම් කර ගෙන, ජාතික මට්ටමින් පත් කරන ලද විශේෂ කණ්ඩායමේ මග පෙන්වීම යටතේ දිස්ත්‍රික් විශේෂඥ කණ්ඩායමක් මගින් උතුරු නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදී. එම වැඩසටහන් 2013 , 2014 හා 2015 වර්ෂ තුල දී ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබීය .

LLRC වාර්තාවේ 9.152 ඡේදයේ සඳහන් පරිදි උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම මෙමගින් සිදු වේ. මේ යටතේ ඉඩම් සංරක්ෂණය, ඉඩම් බෙදා දීම තුලින් පරිසරය ආරක්ෂා කිරීමත්, ජෛව විවිධත්වය සුරැකීමත්, තිරසාර ආර්ථික සංවර්ධනයත්, ජාතික හා සංස්කෘතික පුරාවිද්‍යාත්මක ප්‍රදේශ ආරක්ෂා කිරීමත් ඒ හරහා වර්තමාන හා අනාගත ජීවන තත්වය වැඩිදියුණු කිරීමත් අපේක්ෂා කෙරේ.

2015 වර්ෂය අවසන් වන විට සියලු ම දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර කටයුතු අවසන් කර ඇත. ක්ෂේත්‍රයේ දී මතු වූ ගැටළු සාකච්ඡා කිරීම හා ඊට විසඳුම් ලබා ගැනීම සඳහා පාර්ශව කරුවන් දැනුවත් කිරීමේ ප්‍රාදේශීය මට්ටමේ රැස්වීම් අවසන් කොට ඇත. දිස්ත්‍රික් මට්ටමේ විශේෂඥ කමිටු රැස්වීම් සියල්ලම අවසන් කර ඇත.

අදාළ දිස්ත්‍රික්ක 08 හි ඉඩම් පරිහරණ සැලසුම් 2016 වර්ෂයේ මුල් කාර්තුව තුල දී නිම කිරීමට නියමිත ය.

## LLRC වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පාර්ශවකරුවන් ගේ රැස්වීම් අවස්ථාවන්

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය



මුලතිව් දිස්ත්‍රික්කය



මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



මාරිටිටෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



දිස්ත්‍රික් විශේෂඥ කමිටු රැස්වීම - යාපනය දිස්ත්‍රික්කය

(II) වැවිලි බෝග ඉඩම් සිතියම් ගත කිරීම

කළුතර, ගාල්ල, රත්නපුර, නුවරඑළිය, කෑගල්ල, මහනුවර යන දිස්ත්‍රික්කවල වැවිලි බෝග ඉඩම් සිතියම් ගත කිරීම සිදු කෙරේ. 2015 දෙසැම්බර් වන විට අදාළ දිස්ත්‍රික්කවල වතු ඉඩම් වල ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම් 90% ක් නිම කර ඇත.

(iii) කැළණි ගංගා ද්‍රෝණියේ පාරිසරික ගැටළු හා ඉඩම් පරිහරණය සිතියම් ගත කිරීම.

මෙම වැඩසටහන යටතේ සියලු ම දිස්ත්‍රික්කවල අප ද්‍රව්‍ය කැළණි ගඟට මුදා හරින කර්මාන්ත හා ඒ ආශ්‍රිත ඉඩම් පරිහරණයන් සිතියම් ගත කිරීම නිම කර ඇති අතර වාර්තාව ලියා අවසන් කර ඇත.

(iv) 2015 වසරේ ක්‍රියාත්මක කරනු ලැබූ අනෙකුත් විශේෂ ව්‍යාපෘති

- භූමි හායනය අවම කිරීම පිළිබඳ දස අවුරුදු සැලැස්ම ( 2015-2024 ) සැකසීම සඳහා සහාය වීම.
- අතිගරු ජනාධිපති තුමාගේ අදහසකට අනුව ක්‍රියාත්මක වන "වන රෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක 18 කට ප්‍රතිපාදන ලබා දී ඇත.

## 5.14. වාර්ෂික වැඩ සැලැස්ම සැකසීම සඳහා වැඩමුළුව පැවැත්වීම

2015 වසරේ දී දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සඳහා (සහකාර අධ්‍යක්ෂ දි.ඉ.ප. / ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන්/සංවර්ධන නිලධාරීන්/ ශිල්පීය සහායක) මෙම වැඩමුළුව මහනුවර පොල්ගොල්ල සමූපකාර පුහුණු ආයතනයේ පැවැත්විය. මෙහි දී 2015 වසරේ වැඩ සැලැස්ම පිලිබඳව පුළුල් ලෙස සාකච්ඡා කල අතර නිලධාරීන්ගේ විෂය දැනුම වැඩි දියුණු කිරීම සඳහා විෂයානුබද්ධ දේශනා මාලාවක් ද සංවිධානය කෙරිණ. 2014 වර්ෂයේ සාර්ථක ව්‍යාපෘති නිම කල නිලධාරීන් ඇගයීමද මෙහි දී සිදු විය.

සංවර්ධන වැඩසටහන් ඇගයීමට ලක් වූ අවස්ථාවන්





## 5.15. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

2015 වර්ෂයට අදාලව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය පහත වගුවෙන් දැක්වෙන අතර එය ප්‍රස්ථාරිකව ද වැඩිදුරටත් පැහැදිලි කොට ඇත.

**<u>දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය -2015</u>**

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු | 90 | 80 |
| ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු | 300 | 335 |
| ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් | 25 | 30 |
| බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් -ආදර්ශන | 25 | 45 |
| භායනයට පත් ඉඩම් පුනරුත්තාපන වැඩසටහන් | 25 | 24 |
| පාසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 220 | 226 |
| විශේෂ අධ්‍යයන | 25 | 08 |

### දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් වල ප්‍රගතිය - 2015

